පොදු දේපල සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබැන්ක් පාර, කොළඹ 5

30.10.2019

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජයේ වාහන භාවිතා කිරීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත ලැබුණු පැමිණිල්ලකට අනුව කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු,වාරිමාර්ග සහ ධීවර ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය පී. හැරිසන් මහතා ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා අමාත්‍යාංශයට අයත් වාහන දෙකක් (WP PD 8931) (WP PH 0479) යොදාගනිමින් සිටින බවට තොරතුරු ලැබී ඇත. 2019.10.25 දින මෙම වාහන දෙක ජනතාවට භාණ්ඩ බෙදා දීමේ උත්සවයක් සඳහා යොදාගෙන ඇති අතර මැතිවරණ කොමිෂන් සභාව එය අත්හිටුවන ලදී (මීට අදාළ ඡායාරූප මේ සමග අමුණා ඇත). නමුත් මෙම වාහන තවදුරටත් දේශපාලන කටයුතු සඳහා යොදාගැනෙන බවට තොරතුරු ලැබී ඇත.

මෙසේ රජයේ වාහන හා රියදුරන් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදාගැනීම මගින් 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 2 (ii) හා 5 (i) යන නියමයන් උල්ලංඝනය වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා ඌව පළාත් සම්බන්ධීකාරක අමන්දා පාරමී මෙනවිය හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැලැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.

මෙයට,
විශ්වාසී,

Lakwijaya Bandara

ලක්විජය බණ්ඩාර
ජාතික සම්බන්ධීකාරක (PPPR)



